## විශේෂ නිවේදනයයි.

ඊශ්‍රායලයේ වාසය කරන සියලුම ශ්‍රී ලාංකික ප්‍රජාව වෙත,

කොරෝනා වෛරසයේ ව්‍යාප්තිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් මීට පෙර නිකුත් කරන ලද නිවේදනයන්ට වැඩිමනත් වශයෙණි.

ඊශ්‍රායල් බලධාරීන්ට අනුව කොරෝනා වෛරසය නිශ්චිත වශයෙන්ම ආසාධිත වූවන්ගේ ප්‍රමාණය මේ වන විට 75 දක්වා වර්ධනය වී ඇති අතර මෙම වෛරසය ආසාධිත වී ඇති ද යන්න තහවුරු කර ගැනීම සඳහා අනිවාර්යය නිරෝධායන ක්‍රියාමාර්ග (නිවාස තුල රැඳී සිටීම) සඳහා 100,000 කට වැඩි ප්‍රමාණයක් යොමු කොට ඇත.

මේ අතර, ඊශ්‍රායලයේ සෞඛ්‍ය අමාත්‍යාංශය හා ජනගහන, ආගමන හා දේශ සීමා අධිකාරිය විසින් කොරෝනා වෛරසය ඊශ්‍රායල් රාජ්‍ය තුල පැතිරීයාම වැලැක්වීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග නිර්දේශ කර ඇත.

1) ඊශ්‍රායල් ජාතිකයන්, ඔවුන්ගේ කලත්‍රයන්, දූවා දරුවන්, ඊශ්‍රායලයේ පදිංචිව සිටින නමුත් මෑතකදී විදේශ ගතව සිට පැමිණෙන පුද්ගලයින් සහ සියලුම සංචාරකයින් ද ඇතුලු 2020.03.12 දින ස්ථානීය වේලාවෙන් (ඊශ්‍රායල් වේලාවෙන් ) ප.ව. 8.00 න් පසුව ඊශ්‍රායලයට ඇතුලුවීමට බලාපොරොත්තු වන සියලුම පුද්ගලයින් විසින් දින 14 ක අනිවාර්යය නිරෝධායන ක්‍රියා පිළිවෙතකට යටත් විය යුතුය.

අ. 2020.03.12 වන දින ප.ව. 8.00 ට පෙර ඊශ්‍රායලයට ඇතුල වන සියලුම විදේශීය ගමන් බලපත්‍රලාභීන් සඳහා ;

- චීනය/හොංකොං/තායිලන්තය/සිංගප්පූරුව/මැකාවෝ/ දකුණුකොරියාව/ජපානය/ඔස්ට්‍රියාව /ජර්මනිය/ස්පාඤ්ඤය/ප්‍රංශය/ස්විට්සර්ලන්තය/ඉතාලිය/ඉරානය/ඉරාකය/සිරියාව/ලෙබනනය/තායිවානය/සැන්මැරිනෝ/ අන්ඩෝරා වැනි අවධානම් සහිත රටවල සිට පැමිණෙන සංචාරකයින් ඉහත සඳහන් කල නිරෝධායන ක්‍රියා පිළිවෙතට අනිවාර්යයෙන්ම සහභාගි විය යුතු අතර ඊශ්‍රායලය වෙත පැමිණීමට පෙර ඊශ්‍රායලයේ පිහිටි තම නිරෝධායන ස්ථාන පිළිබඳව ලිපිනයද සහිතව ළගම අති ඊශ්‍රායල් දූත මංඩලය වෙත ලිඛිතව ඉදිරිපත් කර ඒ සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම කල යුතුය.

- ඉහත සඳහන් කල අවධානම් සහිත රටවල් වලට පරිභාහිර රටවල් වල සිට පැමිණෙන සංචාරකයින් ඊශ්‍රායලයට ඇතුලු වීමේදී ඉහත සඳහන් කල පරිදි නිරෝධායන ස්ථාන පිළිබඳව ලිඛිතව ඉදිරිපත් කිරීමක් අවශ්‍ය නොවන නමුත් ඕනෑම අවස්ථාවකදී තමන් ද පරීක්ෂාවට ලක්විය හැකි බව දැන ඒ සඳහා සූදානමින් යුතුව සිටීම.

ආ. 2020 මාර්තු මස 12 වන දින ප.ව. 8.00 ට පසුව ඊශ්‍රායලයට පැමිණෙන සියලුම විදේශ ගමන් බලපත්‍රලාභීන් සඳහා ;

- සියලුම විදේශ ගමන් බලපත්‍ර හිමි පුද්ගලයින් සඳහා ඊශ්‍රායලයට ඇතුලු වීමට අවසර ලැබෙන නමුත් ඔවුන් ඊශ්‍රායලයට ඇතුලු වීම සඳහා ළගම ඇති ඊශ්‍රායල් දූත මණ්ඩලය මඟින් ලිඛිතව තහවුරු කර ගැනීම සහ ඔවුන් ඊශ්‍රායාලයේ නිරෝධායනය වන ස්ථානයේ ලිපිනයන් ලබා දීම අනිවාර්ය වේ.

2) හෝටල් සහ නේවාසිකාගාර නිරෝධායන ස්ථාන වශයෙන් පිළිගැනීමට ලක් නොකරන බැවින් සියලුම පුද්ගලයින් ඊශ්‍රායලයේ පිහිටි තම ස්ථිර වාසස්ථානයේ ලිපිනය ලබා දිය යුතුයි.

3) විදේශයන්හි සිට පැමිණෙන්නන් හට , පුද්ගලයින් 100 ට වඩා රැස්වන ස්ථාන වල ගැවසීම තහනම් වන අතර රෝහල්, වැඩිහිටි නිවාස ආදී ස්ථාන වලට පිවිසීමෙන් වැලකී සිටිය යුතුයි.

4) ඊශ්‍රායලයෙහි දැනට සිටින සංචාරකයින් සඳහා නැවත ඔවුන්ගේ මවුබිම කරා යැමට ගුවන් ගමන් සංවිධානය කිරීම සඳහා දින කිහිපයක් ( පැය 72 ක්) ලබා දෙනු ලැබේ.

5) මීට අමතරව, ඊශ්‍රායලයේ සෞඛ්‍ය අමාත්‍යාංශ විසින් ඊශ්‍රායල් ජාතිකයින් ඇතලු සියලුම සංචාරකයින් හට පහත සඳහන් උපදේශයන් පිළිපදින ලෙස දන්වා ඇත. එනම් ,

i. සෙල්සියස් අංශක 38 හෝ ෆැරන්හයිට් අංශක 100.4 කට අධික උණ රෝගී තත්වය, හදිසි ඇමතුම් අංක 101 අමතා ඒ මඟින් ලබා දෙන මූලික උපදෙස් අනුව කටයුතු කිරීම.
ii. ස්වකීය සනීපාරක්ෂාව පිළිබඳව නිරන්තර අවධානයෙන් යුතුව සිටීම.
iii. මහජනතාව නිතර ගැවසෙන ස්ථාන වලින් දුරස්ව සිටීම.

කෙසේ වෙතත්, හදිසි අවස්ථාවකදී ඒ පිළිබඳව දැනුම් දීම සඳහා පහත සඳහන් දුරකථන අංකය අමතා මෙම තානාපති කාර්යාලය වෙත ඒ පිළිබඳව දැනුම් දෙන මෙන් වැඩිදුරටත් දන්වනු ලැබේ.

රුවන් වික්‍රමසිංහ මහතා - 0547215815
දෙවන ලේකම් (රැකියා හා සුබසාධන)

එමෙන්ම ඊශ්‍රායල් රාජ්‍ය තුල කොරෝනා වෛරසයේ ව්‍යාප්තිය මෙන්ම එය මර්ධනය කිරීම සඳහා දැනට බලපවත්වන උපදෙස් සම්බන්ධයෙන් වැඩිදුරටත් දැන ගැනීම සඳහා පහත දැක්වෙන ඊශ්‍රායලයේ සෞඛ්‍ය අමාත්‍යාංශ වෙබ් අඩවියට පිවිසෙන මෙන් කාරුණිකව දන්වනු ලැබේ.

https://qovextra.gov.il/ministry-of-health/corona/corona-virus-en/

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
ටෙල් අවිව්, ඊශ්‍රායලය.